# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**08 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 02 යි

නම: ........................................................................................ වි. අංකය: ............

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 1-10 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවකි.
   1) ප්‍රවාහනය 2) අධ්‍යාපනය 3) සෞඛ්‍යය 4) ජල සම්පාදනය

2) පහත සඳහන් රෝග අතරින් බෝ නොවන රෝග ගණයට අයත් රෝගයක් වන්නේ,
   1) උණ සන්නිපාතය 2) දියවැඩියාව
   3) ක්ෂය රෝගය 4) ලාදුරු රෝගය

3) රටක සතු වටිනාම සම්පත් වන්නේ
   1) මානව සම්පතයි. 2) වන සම්පතයි
   3) සත්ව සම්පතයි 4) ඛනිජ සම්පතයි.

4) අපරාධ සමාජවිරෝධී ක්‍රියා මැඩලීම සඳහා අවශ්‍ය සහාය ලබාදිම ශ්‍රී ලංකා පොලිසියි හා ආරක්ෂක හමුදා සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් සතු,
   1) අයිතියකි 2) වගකීමකි
   3) යුතුකමකි 4) බලයක්

5) දරුවන්ට මූලික වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අත් දැකීම් ලබාගත හැකි වන්නේ,
   1) පාසල තුළිනි 2) පවුල තුළිනි
   3) අසල්වැසියන්ගෙනි 4) ආගමික ආයතන වලිනි

6) මිනිසා සාමූහිකව වැඩ කරන සෑම අවස්ථාවකම ඔහු මෙහෙයවීම සඳහා
   1) තනතුරක් අවශ්‍ය වේ. 2) පාලනයක් අවශ්‍ය වේ.
   3) කළමණාකරණයක් අවශ්‍ය වේ. 4) නායකයකු අවශ්‍ය වේ.

7) ප්‍රජාතන්ත්‍රවාදී රටවල නායකයින් තෝරා ගැනීමේ ක්‍රමය වන්නේ,
   1) උගත්කම පදනම් කරගෙනය 2) දේපළ හිමිකම පදනම් කරගෙන
   3) ඡන්ද බලය පදනම් කරගෙනය 4) ධනවත් කම පදනම් කරගෙනය.

8) ඕනෑම සමාජයක පවතින සිරිත් විරිත් සම්ප්‍රදායන් අනාගත පරපුර වෙත පවරා දෙනු ලබන්නේ,
   1) සංවිධාන මගිනි 2) අධ්‍යාපනය මගිනි
   3) සංස්කෘතිය මගිනි 4) ආගමික මධ්‍යස්ථාන මගිනි

9) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩ ගැසී ඇත්තේ,
   1) ජනවර්ගය මුල් කරගෙන ය. 2) පළාත් මුල්කරගෙන ය.
   3) ආගම් මුල්කරගෙන ය. 4) භාෂාව මුල්කරගෙන ය.

10) ආපදා ඇතිවීම සම්පූර්ණයෙන්ම වැළැක්විය නොහැකිය. එහෙත් ආපදා මගින් ඇතිවිය හැකි හානි අවම කරගත හැකිය. මෙම ක්‍රියාවලිය.
   1) ආපදා අවම කිරීම ලෙස හඳුන්වයි.
   2) ආපදා කළමණාකාරණය ලෙස හඳුන්වයි.
   3) ආපදා වැළැක්වීම ලෙස හඳුන්වයි.
   4) ආපදාවලට මුහුණ දීම ලෙස හඳුන්වයි.

- **පහත අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ''අ'' සහ ''ආ'' තීරු එකිනෙක ගලපා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

11)

| ''අ'' පොදු සේවා | ''ආ'' පොදු සේවා ආයතන තුළින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් |
|---|---|
| 1. ජල සම්පාදනය | A මඟී ආරක්ෂාව සහතික කිරීම. |
| 2. අධ්‍යාපනය | B පාරිභෝගික සේවා පහසු මිලය සැපයීම. |
| 3. ප්‍රවාහනය | C පානීය ජලය සැපයීම |
| 4. සමූපකාරය | D සමාජයට වැඩදායී පුරුවැසියන් බිහිකිරීම |

I) CDAB II) CDBA III) ACBD IV) DCAB

12)

| ''අ'' ළමා අයිතකිවාසිකම් | ''ආ'' ළමා යුතුකම් |
|---|---|
| 1. මිතුරු සබඳතා පැවැත්වීම. | A පාසල් විනය නීතිරීති සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම. |
| 2. සමිති සමාගම්වලට සම්බන්ධවීම | B මව්පිය වැඩිහිටියන්ට ගරු කිරීම. |
| 3. නිසි රැකවරණය ලැබීම | C සමාජ සංවර්ධනයට සහාය වීම. |
| 4. අධ්‍යාපනය ලැබීම | D සොරකම් වංචා හිංසාකාරී ක්‍රියාවන්ගෙන් වැළකීම. |

I) DCAB II) CDBA III) DCBA IV) CBAD

13)

| ''අ'' නායකත්වය | ''ආ'' නායකත්ව ශෛලිය |
|---|---|
| 1. ඒකාධිපති නායකත්වය | A පැහැදිලි අරමුණු ඉලක්ක නොතිබීම. |
| 2. දූෂිත නායකත්වය | B ප්‍රශ්නවලට සවන්දීම ප්‍රශ්න විසඳීම. |
| 3. නාමික නායකත්වය | C ජනතා අදහස් පිළිනොගැනීම. |
| 4. ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය | D පොදු දේපළ අයුතු ලෙස පරිභෝජනය කිරීම. |

I) DCAB II) ABDC III) CDBA IV) CDAB

14)

| ''අ'' ආපදා | ''ආ'' හානි අවමකරගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|
| 1. අකුණු කුණාටු | A ඉක්මණින් ආරක්ෂිත ස්ථාන කරා යාමට කටයුතු කිරීම. |
| 2. සුනාමි | B එළිමහන් ස්ථානවල රැඳී සිටීමෙන් වළකින්න. |
| 3. නියඟ | C ගං වතුරට හසු වූ ආහාර ගැනීමෙන් වළකින්න. |
| 4. ගංවතුර | D ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කරන්න. |

**I) BACD II) ABDC III) BADC IV) CDAB**

15)

| ''අ'' උත්සව | ''ආ'' සංස්කෘතිය |
|---|---|
| 1. පොසොන් උත්සවය | A ඉස්ලාම් සංස්කෘතිය |
| 2. මහ ශිව රාත්‍රී උත්සවය | B බෞද්ද සංස්කෘතිය |
| 3. නත්තල් උත්සවය | C කතොලික සංස්කෘතිය |
| 4. හජ්ජි උත්සවය | Dහින්දු සංස්කෘතිය |

I) BDAC II) BDCA III) DBCA IV) CBAD

- **පහත අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

16) මාර්ග අනතුරු වළක්වා ගැනීමේදී මාර්ග නීති නිසි පරිදි අනුගමනය කිරිම........................................ වගකීමකි.
(රියදුරන්, රජයේ, පොලීසියේ)

17) සම්පත් අරපරිස්සමින් භාවිතා කිරිම ................................................................ සඳහා කෙරෙන දායකත්වයකි.
(සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, තිරසාර සංවර්ධනය)

18) ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක පුරවැසියන් වශයෙන් තම .........................................................සුහවාදීව හසුරුවා ගත යුතුය.
(සංවේග, චිත්තවේග, මතභේද)

19) නායකයකු කණ්ඩායම මෙහෙයවන විට .............................................................. විශ්වාසයෙන් යුතුව කටයුතු කළ යුතුය.
(සහායකයා, අනුගාමිකයා, පාලකයා)

20) මෑතකදී ලෝක සෞඛ්‍ය සංවිධානය ශ්‍රී ලංකාවෙ ............................................................... රෝගය දුරකළ රටක් බවට ප්‍රකාශ කරන ලදි.
(ඩෙංගු. බරවා, මැලේරියාව)

(ලකුණු 2 x 10)

## පුරවැසි අධ්‍යාපනය - II

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම **අනිවාර්ය** වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

1) i) ඔබ පාසලේ දැනට ක්‍රියාත්මකව පවතින ශිෂ්‍ය සමිති දෙකක් නම් කරන්න. (ලකුණු -2)
   ii) එම ශිෂ්‍ය සමිතිවල ඔබ දරණ තනතුරු මොනවාදැයි ලියන්න. (ලකුණු -2)
   iii) ශිෂ්‍ය සමිති සඳහා නිලධාරී මණ්ඩලය පත් කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග එකක් පැහැදිලි කරන්න. (ලකුණු -4)
   iv) ඔබ සමිතිය තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු -4)
   v) පාසල් ශිෂ්‍ය සමිතියේ සාමාජිකත්වය ලැබීම තුළින් ඔබ ලබාගත් අත් දැකීම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -4)

2) i) පොදු සේවා අවශ්‍ය විමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු -2)
   ii) පොදු සේවාවල පොදු ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු -4)
   iii) පොදු සේවාවක් ලෙස පානීය ජලය අවශ්‍ය වීමට හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

3) i) රජය මගින් සපයනු ලබන පොසු සේවා දෙකක් නම් කරන්න. (ලකුණු -2)
   ii) එම පොදු සේවා සපයන ආයතන හා එම ආයතනවලින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් පහත සඳහන් පරිදි සටහන් කරන්න. (ලකුණු -4)

| පොදු සේවාව | සපයන ආයතනය | ආයතන තුළින් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් |
|---|---|---|
| 1 | | |
| 2 | | |

   iii) ඔබ ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා දෙකක් සඳහන් කර ඒවා ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

4) i) පවුලක් තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු -2)
   ii) පවුලක් තුළ සාමාජිකයින් සමගියෙන් කටයුතු කරනු ලබන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු -4)
   iii) ''නිවසක් තුළ සාමකාමී පරිසයක් පැවතීම ඕබේ දියුණුවට හේතුවේ.'' විස්තර කරන්න. (ලකුණු -5)

5) i) පාසල තුළ නායකත්ව ලක්ෂණ දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු -2)
   ii) නායකයකු සතුවිය යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු -4)
   iii) යහපත් පුරවැසියකු ලෙස ජීවත්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පුරුදු බවට පත්කර ගත යුතුය. කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු -5)

6) i) ශ්‍රී ලංකාවේ වෙසෙන ජනවර්ග දෙකක් ලියන්න. (ලකුණු -2)
   ii) බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු -4)
   iii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයකි. මෙම සමාජයේ ජීවත් විමේදී ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු -5)

7) i) ස්වභාවික විපත් දෙකක් නම් කරන්න. (ලකුණු -2)
   ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් හතරක් ලියන්න. (ලකුණු -4)
   iii) අපේ පැරණි මුතුන් මිත්තන් එදිනෙදා ජීවිතයේදී බොහෝ කටයුතු ඉටුකර ගැනීමේදි 'තිරසර සංවර්ධන' සංකල්පය අනුව කටයුතු කර ඇත. උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු -5)